**ගම්පහ මහා නගර සභාව - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ගම්පහ මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

### 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රමිතියේ 3.26 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී, මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ අඩුවීම රු.110,285,002 ක් වුවත්, ශුද්ධ වැඩිවීම රු.238,821,217 ක් වී තිබුණු බැවින්, එමගින් මුදල් ප්‍රවාහය නිවැරදිව නිරූපණය වී නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

#### 1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කරන මාරුකිරීම් ආදායම රු.4,799,664 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම රු.62,693,978 ක් ස්කන්ධය ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ ) | සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු එකතුව රු.2,439,827 ක කුලී ආදායමක් විස්තීර්ණ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පාරවල්, පාලම්, බෝක්කු සහ කාර්යාල උපකරණ ක්ෂය වටිනාකම් පිළිවෙළින් රු.734,391 ක් අඩුවෙන් සහ රු.94,876 ක් වැඩියෙන්ද ගිණුම්ගතකර තිබුණි. | 2024 අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව. | එම |
| (ඈ) | ණය හිමියන්ට රු.7,387,186ක් ගෙවීමේදී වියදම් ගිණුම හර කිරීමේ වරද නිවැරදි කිරීමේදී, වියදම් ගිණුම බැර කරනු වෙනුවට තොග ගිණුම බැර කර තිබුණි. | එම | එම |
| (ඉ) | වටිනාකම රු.5,048,002 ක ප්‍රාග්ධන ණයහිමි අධි වෙන්කිරීමක් කපාහැරීමේදී, අදාල කෙරීගෙන යන වැඩ ගිණුමට බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල බැර කර තිබුණි. | එම | එම |
| (ඊ) | දේශීය ණය සංවර්ධන අරමුදලට වැඩිපුර ගෙවා තිබුණු ණය වාරික සහ පොලී වටිනාකම රු.1,832,782 ක් ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කළයුතු වුවත්, වාරික වටිනාකම දිගු කාලීන ණය ගිණුම හර කර, පොලී වටිනාකම වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එම | එම |
| (උ) | ස්ථාවර වත්කම් 3 කට අදාල ක්ෂය ලෙස රු.331,549 විස්තීර්ණ වියදමට වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | එම | එම |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 10 ක මූල්‍ය ප්‍රකාශන අනුව සහ ආදායම් අයකරගැනීම් ප්‍රගති වාර්තාව අනුව රු.6,273,321 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රගති වාර්තා සංශෝධනය කර ඉදිරිපත් කරන බව. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලැබියයුතු වෙළඳ ස්ථාන කුලී ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.28,427,450 ක් සහ කාලවිශ්ලේෂණය අනුව රු.35,273,240 ක් වීමෙන් රු.6,845,790 ක වෙනසක් නිරීක්ෂණය විය. | කපා හැරීම සඳහා යොමු කළ මුදල සැලකිල්ලට ගෙන නැති බව. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුය. |
| (ඇ) | 2022 සහ 2023 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනවලදී වර්ෂයට අදාල පූර්ව වර්ෂවල පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් පිළිබඳව විගණනයට ඉදිරිපත් කළ තොරතුරුවල රු.4,579,556 ක වෙනසක් විය. | වෙනස සොයා බලා පසුව වාර්තා කරන බව | එම |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කරන මාරුකිරීම් | 11,662,101 | බැර සටහනට අදාල හර සටහන ගිණුම්ගත කළ ආකාරය | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | නිවැරදි තොරතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

1.7.1 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන ආඥා පනත | 2005 හා 2011 වර්ෂවලදී කරන ලද තක්සේරු පදනම් කරගෙන ප්‍රවර්තන වර්ෂයේ වරිපනම් අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇති බව. | තක්සේරුව කරවාගෙන, නව රේට අනුව වරිපනම් අය කළ යුතුය. |
| (ආ) | මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග | | | |
| | (i) 08 | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය දින 28 ක් ප්‍රමාද වී 2023 මාර්තු 28 දින ඉදිරිපත් කරන ලදී. | ඉදිරි වර්ෂයේදී එසේ නොවීමට වග බලා ගන්නා බව. | නියෝග අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 38 | දේපල තහනම් කිරීමේ නිලධාරීන් තිදෙනෙකු විසින් 2023 ජූනි, ඔක්තෝම්බර් සහ දෙසැම්බර් මාසවල අවස්ථා 15 කදී අයකර තිබුණු හිඟ වරිපනම් වටිනාකම රු.70,000 ක් දින 10 ත් 68 ත් අතර කාලයක් අත රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී නොකිරීමට උපදෙස් ලබා දී ඇති බව. | නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) 83 II | සේවක ණය සඳහා අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සීසී 10 ණය ලේඛනය, ණය ලෙජරය සහ සේවක ණය ගිණුම පවත්වා ගෙන යන බව. | එම |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු. රෙ. 396 (ආ) | වසර ගණනාවක සිට පැවත එන රු.706,560 ක් වටිනා අගරු චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) මු. රෙ. 571 | 1997 වර්ෂයේ සිට පැවත එන වටිනාකම රු.46,821,457 ක්වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරන බව. | එම |
| | (iii) මු. රෙ. 757 | ඌනතා හා නැතිවීම් 23 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | 2024 ජූනි 30 ට පෙර කටයුතු කරන බව. | එම |
| (ඈ) | 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(i) දරන පළාත් පාලන දෙපාර්තමේන්තු (බස්නාහිර පළාත) චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී 2016 සහ 2019 වර්ෂවල තක්සේරු මත ජා-ඇල බස් නැවතුම සාප්පු සංකීර්ණයට, මධ්‍යම බස් නැවතුම්පල අදියර 01 ට සහ 04 ට අදාළ කඩ කුලී අයකර තිබුණි. තවද අංක CBS 422 දරන කඩ කාමරය පැවරීමේදී, කඩ කුලිය මෙන් 60 ගුණයක් වන රු.498,000 ක් අයකරගෙන නොතිබුණි. | තක්සේරුව ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින බව හා ඉදිරියේදී අය කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.7.2. **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ දැක්වීම** | **අදහස් නිර්දේශය** |
|---|---|---|
| ගෙවිය යුතු එකතුකළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ උපයන විට ගෙවීමේ බදු වටිනාකම රු.402,746 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ශේෂ නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.111,022,252 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.53,423,602 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 88,502,000 | 94,648,751 | 89,841,175 | 90,631,278 | 84,501,500 | 102,621,334 | 70,352,564 | 89,286,429 |
| (ii) | කුලී | 39,570,000 | 43,970,697 | 41,530,870 | 46,358,622 | 38,670,000 | 40,507,851 | 25,684,786 | 45,108,379 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 9,800,000 | 10,958,152 | 10,958,152 | 648,338 | 5,800,000 | 5,365,608 | 4,974,608 | 717,427 |
| (iv) | වෙනත් ආදායම් | 91,536,000 | 209,484,902 | 217,384,231 | 5,221,813 | 367,411,000 | 464,185,713 | 463,168,538 | 84,503,489 |
| | | 229,408,000 | 359,062,511 | 359,714,428 | 142,860,051 | 496,382,500 | 612,680,506 | 564,180,496 | 219,615,724 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් අයකර ගැනීමේ ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයට අදාල රු.142,479,223 ක් වූ සමස්ථ බිල් කළ ආදායමෙන් ප්‍රවර්තන අය කිරීම් රු.93,841,742 ක් වූයෙන් රැස්කරගත් ප්‍රතිශතය සියයට 66 ක් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.176,662,043 ක් වූ සමස්ථ හිඟ ආදායමෙන් අයකිරීම් රු.65,067,166 ක් වූයෙන් හිඟයෙන් අයකරගත් ප්‍රතිශතය සියයට 37 ක් වී තිබුණි. | දේපළ තහනම් කරනු ලබන නිලධාරීන් බඳවා ගැනීම, ජංගම සේවා පැවැත්වීම, දේපළ තහනම් කිරීම හා කඩ සීල් තැබීම මඟින් අය කිරීම් සිදු කරන බව. | හිඟ ආදායම අයකළ යුතුය. |
| (ආ) | වරිපනම් හා බදු | | |
| (i) | කාල විශ්ලේෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් ශේෂය රු.79,850,570 ක් තුල, වසර 10 ට වැඩි ශේෂය රු.13,667,261 ක්ද, වසර 5 ක සිට වසර 10 ක් අතර ශේෂය රු.23,225,705 ක්ද, වසර 3 ක සිට වසර 5 ක් අතර ශේෂය රු.18,974,512 ක්ද, වසර 1 ක සිට වසර 3 ක් අතර ශේෂය රු.13,281,818 ක්ද, වසර 1 ට අඩු ශේෂය රු.10,701,273 ක්ද විය. | 2022 වර්ෂයේ සෑම කාර්තුවක් අවසානයේදී රතු නිවේදන නිකුත් කර ඇති බව. | හිඟ වරිපනම් ආදායම අයකළ යුතුය. |
| (ii) | ඉහත හිඟ වට්නාකම් ශේෂය තුල වට්නාකම රු.25,000 ට වැඩි දේපල 313 ක හිඟය රු.20,109,425 ක් වී තිබුණි. | ආදායම් පරීක්ෂක නිලධාරින්ට විසින් රතු නිවේදන නිකුත් කර ඇති බව. | එම |
| (iii) | වැරදි බිල් කිරීම් හඳුනාගෙන තිබුණු දේපල 9 ක සහ තහනම් කළයුතු බවට හඳුනාගෙන තිබුණු නිශ්චල හා චංචල දේපල 81 ක හිඟ වරිපනම් වට්නාකම පිළිවෙලින් රු.780,403 ක් සහ රු.7,858,194 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | නිශ්චල දේපළ තහනම් කිරීමේ මූලික කටයුතු සිදු කරන බව . | එම |
| (iv) | ආදායම් අයකර ගැනීම් ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ හිටි විනෝද බදු ශේෂය වූ රු.7,639,858 කින් වර්ෂය තුල රැස්කළ ආදායම රු.1,768,462 ක් වීමෙන් අයකරගත් ප්‍රතිශතය සියයට 23 ක් සහ සමාලෝචිත වර්ෂයට බිල් කළ වට්නාකම රු.7,484,091 කින් වර්ෂය තුල රැස්කළ ආදායම රු.2,654,735 ක් වීමෙන් රැස්කර ගත් ප්‍රතිශතය සියයට 35 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි. | අයකර ගැනීමට නීති කර්තව්‍යයන් අරඹා ඇති බව. | හිඟ විනෝද බදු ආදායම අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ කර්මාන්ත හා ව්‍යාපාර බදු හිඟ ශේෂය රු.1,176,190 කින්, රැස් කළ ආදායම රු.329,000 ක් එනම් සියයට 28 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. | හිඟය සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ කර්මාන්ත හා ව්‍යාපාර බදු ආදායම අයකළ යුතුය. |
| (ඇ) | කුලී | | |
| (i) | ආදායම් අයකර ගැනීම් ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයට අදාල බිල් කළ වෙළඳ ස්ථාන කුලී වටිනාකම රු.51,323,511කින් රැස් කළ ආදායම රු.19,510,255 ක් එනම් සියයට 38 ක් වැනි අඩු ප්‍රතිශතයක් වී තිබුණි. | කඩ හිමියන් වෙත ලිඛිතව දැනුවත් කරමින් පවතින බව. | හිඟ වෙළඳ ස්ථාන කුලී ආදායම අයකළ යුතුය. |
| (ii) | කාල විශ්ලේෂණය අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ කඩ කුලී ශේෂය, වසර 5 ක සිට වසර 10 ක් අතර රු.16,758,012 ක්ද, වසර 3 ක සිට වසර 5 ක් අතර රු.4,070,808 ක්ද, වසර 1 ක සිට වසර 3 ක් අතර රු.2,631,000 ක්ද, වසර 1 ට අඩු රු.3,272,696 ක්ද වී තිබුණි. | කොවිඩ් කපා හැරීමද සැලකීමෙන් පසුව අවසන් දිනට හිඟ ශේෂය රු.26,732,516 ක් බව. | හිඟ වෙළඳ ස්ථාන කුලී ආදායම අයකළ යුතුය. |
| (iii) | 2021 වර්ෂයේ සිට පැවත එන හිඟ සතිපොල බදු කුලිය රු.1,303,647 ක් අයකරගෙන නොතිබුණි. | නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | සතිපොල හිඟ බදු කුලිය අයකළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ මස්කඩ ටෙන්ඩර් කුලී රු.90,015 ක් අයකර නොතිබුණි. | එම | හිඟ මස්කඩ ටෙන්ඩර් කුලී අයකළ යුතුය. |
| (v) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.7,318,580 ක් වූ හිඟ තානායම් කුලී ශේෂයෙන් රැස්කිරීම රු.11,000 ක් වූයෙන් රැස්කර ගත් ප්‍රතිශතය සියයට 0.2 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාලව බිල් කිරීම් වටිනාකම රු,1,938,652 කින් කිසිදු මුදලක් රැස්කර නොතිබුණි. | අයකර ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැන්වීමටත්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් නියමිත බව. | හිඟ තානායම් කුළී ආදායම අයකළ යුතුය. |
| (vi) | කඩා ඉවත්කළ පොදු වෙළඳපල කඩ කාමර 142 ක හිඟ කඩ කුලිය රු.2,129,775 ක් ද, තාවකාලික කඩ ලබා නොදුන් කඩ කාමර 25 ක හිඟ කඩ කුලිය රු.667,047 ක් ද විය. | හිඟ කඩ කුලී සම්බන්ධව දන්වා යවා ඇති බව. | හිඟ ආදායම අයකළ යුතුය. |
| (vii) | ගිවිසුම්ගතවූ තාවකාලික කඩ කාමර 25 ක හිඟ කුලිය රු.837,688 ක් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල ක්‍රියාමාර්ග ගන්නා බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.1,900,985 ක්වූ හිඟ වාහන නවතා තැබීමේ ගාස්තු අයකර නොතිබුණි. | නෛතික ක්‍රියා මාර්ග ගෙන ඇති බව. | හිඟ වාහන නවතා තැබීමේ ගාස්තු ආදායම අයකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පහ නගර සභාවට අයත් ඔරුතොට පාර ප්‍රධාන රථගාල අසල දෙමහල් වෙළඳ සංකීර්ණ පරිශ්‍රය පිටුපස පැවති පොදු මාර්ගය, අඩි 15 ක් පමණ පළලින් හා අඩි 300 ක් පමණ දිගින් යුතු ජලය බැස යාමේ කාණු පද්ධතිය ගේට්ටු දමා ආවරණය කර, වෙළඳ සැල් හිමියන් විසින් අනවසර ඉදිකිරීම් සිදුකර තිබුණු නමුත් සභාව විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් ඉවත් කර ගන්නා ලෙස දැනුවත් කර ඇති අතර, ඉවත්කළ පසු පොදු කටයුතු සඳහා භාවිතා කරන බව. | අනවසර ඉදිකිරීම් ඉවත් කර පොදු කටයුතු සඳහා ලබාදිය යුතුය. |
| (ආ) | 1980 අංක 56 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය ප්‍රකාරව මහා නගර සභාව විසින් ක්‍රියාත්මක කරන ආදාහනාගාර 2 ක් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | අයදුම්පත මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පනත අනුව කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩිපුර ගෙවා තිබුණු දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය වාරික වටිනාකම රු.1,664,305 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | නිරාකරණය කිරීමට කටයුතු කරන බව. | ශේෂය නිරවුල් කරගත යුතුය. |
| (ආ) | 1989 ජනවාරි 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට්පත්‍රයට පටහැනිව 2022 ජූලි 15 දිනැතිව මහා සභාව විසින් දැන්වීම් පුවරු ඉදිකිරීම හා නඩත්තු කිරීමේ බලතල පුද්ගලික ආයතනයකට ලබාදී තිබුණු බැවින් එදින සිට සභාව විසින් බලපත්‍ර කිසිවක් නිකුත්කර නොතිබුණි. නගරයේ අලංකරණයට බාධා වන සහ අනාරක්ෂිත දැන්වීම් ඉවත් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ප්‍රචාරණ ගාස්තු අය කර ලදුපතක් නිකුත් කරන අතර බලපත්‍ර නිකුත් කර නොමැත. ඒ සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින බව. | ගැසට්පත්‍රය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජා ඇල බස් නැවතුම සාප්පු සංකීර්ණයේ ශාලා 3 ක් බදු පදනම මත ලබා දීමට කරන ලද රජයේ තක්සේරුවේදී සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබීමත්, ශාලා 3 වසා තිබුණද බිල් කරමින් පැවති බැවින් සභාවට පවරා නොගෙන ටෙන්ඩර් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීම වෙනුවෙන් ගෙවා තිබුණු රු.95,220 ක් සහ බදු පදනම මත ලබා දුන්නේ නම් ලබාගතහැකිව තිබුණු ආදායම අහිමිවීමත් සභා අරමුදලට කරන ලද අලාභයන් බව නිරීක්ෂණය විය. | නිවැරදි තක්සේරුව ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | අලාභය අය කර නිවැරදි තක්සේරුව අනුව විධිමත් පරිදි ටෙන්ඩර් කළ යුතුය. |
| (ඇ) | පෙර මුදල්, කඩ කාමර බදු දීමට පෙර අයකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ පෙර මුදල් ශේෂය රු.33,324,495 ක් තුල වසර 5 ත් 10 ත් අතර රු.22,836,846 ක්ද, වසර 3 ත් 5 ත් අතර රු.8,252,649 ක්ද, වසර 1 ත් 3 ත් අතර රු.1,945,000 ක්ද, වසර 1 ට අඩු රු.290,000 ක්ද අය වීමට පැවතිණි. | කඩ කාමර පවරා ගැනීමට කටයුතු කරන බව. | හිඟ පෙර මුදල් ආදායම අයකළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.34,164,747 ක හිඟ පෙර මුදල් ශේෂයෙන් රු.1,232,498 ක් එනම් සියයට 4 ක් පමණක් අයකර තිබුණි. | ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිත බව. | එම |

**3.3. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 21 ක් ගිවිසුමේ 01 කොන්දේසියට පටහැනිව වෙනත් වෙළඳාම් කටයුතු සිදු කිරීමත්, සියළු කඩ කාමර ගිවිසුමේ 7 කොන්දේසියට පටහැනිව මාසික කුලිය ඊලඟ මාසයේ 10 දින හෝ ඊට පෙර ගෙවා නොතිබීමත්, කඩ කාමර 10 ක් බදු ගිවිසුමේ 9 කොන්දේසියට පටහැනිව වෙනස්කර තිබීමත්, කඩ කාමර 42 ක් 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/211/දෙ.චක්‍ර/2020 දරන චක්‍රලේඛය හා බදු ගිවිසුමේ 10 කොන්දේසියට පටහැනිව අතුරු බදු දී තිබීමත්, කඩ කාමර 31 ක් ගිවිසුමේ 21 කොන්දේසියට පටහැනිව දීර්ඝ කාලයක සිට වසා දමා තිබීමත්, නිරීක්ෂණය වුවද ගිවිසුමේ 5 කොන්දේසිය ප්‍රකාරව කඩ කාමර සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කර නොතිබුණි. | ඉදිරියේ දී අවශ්‍ය කටයුතු කරන බව. | ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | විධිමත් බදු ගිවිසුම් නොමැතිව 2013 සහ 2016 වර්ෂවලදී ලබාදී තිබුණු CBS V 04 සාප්පු සංකීර්ණයේ කඩ කාමර 5 ක් 2020 වර්ෂයේදී | සාධාරණීකරණ වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන බව. | ආදායම ලෙස හදුනා ගැනීමත් අයකිරීමත් කළ යුතුය. |

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | තක්සේරු කර තිබුණද, සභාව විසින් මේ සම්බන්ධයෙන් කිසිදු ආදායමක් හඳුනාගැනීමක් හෝ අයකර ගැනීමක් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.2,280,925 ක කුලී ආදායමක් සහා අරමුදලට කරන ලද අලාභයක් බව නිරීක්ෂණය විය. | | |
| (ඈ) | මධ්‍යම බස් නැවතුම්පල අදියර 01 අංක 19 A දරන කඩ කාමරය සඳහා 2006 වර්ෂයේදී සභාව සමග ගිවිසුම්ගතව තිබුණු කඩ හිමියා 2013 වර්ෂයේදී අවුරුදු 05 ක කාලසීමාවකට බාහිර ආයතනයක් සමඟද, බදු ගිවිසුමක් ඇතිකරගෙන නගර සභාවට ගෙවීම් නතර කර තිබුණද සභාව විසින් එම තත්ත්වය නිරවුල් කරගෙන හිඟ කඩකුලී ශේෂය රු.893,335 ක් අය කරගෙන ද නොතිබුණි. | මේ සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇති බව. | ගැටළුව නිරවුල් කරගෙන හිඟ කඩ කුලී අයකරගත යුතුය. |

## 3.4. වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 09 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ii) වගන්තියට පටහැනිව, ගම්පහ මහා නගර සභාවේ නිලධාරිනියක විසින් මහා නගර සභාවේ වාහන 2 ක් 2023 අප්‍රේල් සිට අගෝස්තු දක්වා අවස්ථා 13 කදී භාවිතාකර තිබුණු අතර මේ හේතුවෙන් සභා අරමුදලට සිදුවූ අලාභය ගණනය සඳහා ධාවන සටහන් විගණනය වෙත ලබා දී නොතිබුණි. | ධාවන සටහන් පළාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශන අංශයට භාරදී ඇති බව. | ධාවන සටහන් විගණනය වෙත ලබා දිය යුතු අතර, අලාභය අයකළ යුතුය. |
| (ඇ) | ජා-ඇල බස් නැවතුම සාප්පු සංකීර්ණයේ වහලය කැඩී පැවතීමත්, ඉහල මාලයේ ශාලා 03 ක් සහ කඩ කාමර 08 දීර්ඝ කාලයක් වසා දමා තිබීමත්, පරවි වසුරු නිසාත් ඉතාමත් අපිරිසිදු වී තිබුණි. තෙවන මහලට අනවසර පැමිණීම වැලැක්වීමට යොදා තිබුණු දොර හා ඉබි යතුරු කඩා දමා කාමර තුල හා පිටින් අනවසරයෙන් බඩු ගොඩගසා තිබුණි. කඩ කාමරවල දොරවල් ගැලවී තිබුණු අතර ජල පහසුකම් සහ භාවිත කළ හැකි මට්ටමේ වැසිකිළි පද්ධතියක් ද නොතිබුණි. | අදාල අංශ දැනුවත් කර ඇත. | වත්කම් නිසි පරිදි නඩත්තු කිරීමත් විධිමත්ව ටෙන්ඩර් කිරීමත් කළ යුතුය. |

## 3.5. ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව සැපයුම් ආයතනය තෝරාගෙන මහා නගර සභා ආඥා පනතේ 188(1) වගන්තියේ සඳහන් සභා අරමුදලින් කළහැකි ගෙවීම් වලට පටහැනිව සභා අරමුදලින් රු.854,400 ක් ගෙවීම් කර නිලධාරීන් සඳහා සාරි 96 ක් මිලදී ගෙන තිබුණු අතර සාරි 48 ක් නිලධාරීනියන් වෙත ලබාදී, රු.427,200 ක් වූ සාරි 48 ක් නාගරික කොමසාරිස් කාර්යාලයේ ගබඩා කර තිබුණු හෙයින්, එම වියදම ද නිෂ්කාර්ය වී තිබුණි. | නිරීක්ෂණය නිවැරදියි. සේවක සුභ සාධනය උදෙසා යෝජනාව සභා සම්මත කර ඇති අතර ගබඩාවේ ආරක්ෂිතව තබාගැනීමේ පහසුකම් නොමැති බැවින් එසේ කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට, මහා නගර සභා ආඥා පනතට අනුව කටයුතු කළ යුතු අතර නිෂ්කාර්ය වියදම වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකළ යුතුය. |

## 3.6. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වෙළඳ කුටියක් ඉදිකිරීමේ කර්මාන්තය 2022 අප්‍රේල් 08 දින මාස 03 කින් නිම කිරීමට ගිවිසුම්ගත වී, දින 56 ක් ගතවූ පසු විවිධ හේතු දක්වා ඉටුකළ නොහැකි බව ප්‍රජා මණ්ඩලයක් විසින් දැනුම්දී තිබියදී, එම කොන්ත්‍රාත් ගිවිසුම කඩ කළ සංවිධානය අසාධු ලේඛනගත නොකර, තාක්ෂණික නිලධාරි විසින් නැවත පෙර ඇස්තමේන්තුවට වඩා රු.1,760,228 ක් වැඩිවන පරිදි රු.4,254,672 ක නව ඇස්තමේන්තුවක් සකස්කර, පළමු ගිවිසුම කඩ කළ ප්‍රජා මණ්ඩලය සමග උක්ත කර්මාන්තය ඉටුකරගැනීමට නැවත ගිවිසුම් ගතවී තිබුණි. | ස්වර්ණ සහන ප්‍රජා මණ්ඩලය සමඟ ගිවිසුම් ගත වී ඇත. එම ගිවිසුම ප්‍රකාරව ගිවිසුම්ගත වූ දින සිට මාස 03 ක් ඇතුළත සම්පූර්ණ කළයුතු බවට දක්වා ඇති බව . | ගිවිසුම්ගත වූ දින සිට වැඩ ආරම්භ කිරීමට කටයුතු සැලැස්වීම සඳහා සභාවේ නිසි අධීක්ෂණයක් සිදුවිය යුතුය. ගිවිසුම් කඩ කළ ප්‍රජා මණ්ඩලය අසාධු ලේඛනගත කර නැවත ගිවිසුම් ගත නොවිය යුතුය. |
| (ආ) | නව ගිවිසුම අනුව ද ඉදිකිරීම මාස 3 කින් ඉටු කළයුතු වුවත්, රු.1,876,479 ක් වූ කාර්යයන් 24 ක් ගිවිසුම්ගතවී වසරක් ගතවුවද, නිමකර නොතිබීම හේතුවෙන් අතුරු ගෙවීම් වටිනාකම රු.2,104,014 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | එම ගිවිසුම ප්‍රකාරව ගිවිසුම්ගත වූ දින සිට මාස 03 ක් ඇතුළත සම්පූර්ණ කළයුතු බවට දක්වා ඇති බව. | නිෂ්කාර්ය වියදම වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයකළ යුතුය. |

## 3.7. මානව සම්පත් කළමනාකරණය

| | | | |
|---|---|---|---|
| (අ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සභාවේ සේවා කාලය වසර 6 ත් 12 ත් අතර වූ නිලධාරීන් 09 දෙනෙකු සේවා ස්ථාන අතර මාරු කිරීම් සිදුකර නොතිබුණි. | පිළිගන්නා බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ජා ඇල බස් නැවතුම සාප්පු සංකීර්ණය පිරිසිදු කිරීමට යොදවා තිබුණු සේවකයින් පිරිසිදු කිරීම් සිදුනොකරන බවත්, ඒ සඳහා පත්කර ඇති පරිපාලකවරයා කිසිදු පරිපාලන කටයුත්තක් සිදුනොකරන බවත්, ඔහු එහි රැඳී නොසිටින බවත් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | වෙළඳසැල් පරිපාලක මගින් අදාල පිරිසිදු කිරීම් කටයුතු නිසි අධීක්ෂණයක් යටතේ සිදු කරන බව. | පිරිසිදු කිරීම නිසි පරිදි අධීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | සේවය අතහැර ගිය, මියගිය, විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවී ගිය සේවකයන් 46 දෙනෙකුගෙන් ණය හා අත්තිකාරම් ශේෂය රු.1,729780 ක් හිඟ හිටව පැවතිණි. | සේවය අතහැර ගිය අයගේ ඇපකරුවන් නොමැති බවත්, විශ්‍රාමිකයින් 31 දෙනෙකුගේ මුදල් 2024 වර්ෂයේදී ලැබී ඇති බවත්, සේවකයින් 07 දෙනා සඳහා ලිපි යවා ඇති බවත්, විශ්‍රාමිකයන් 22 දෙනෙකුගේ තොරතුරු සොයාගත නොහැකි බව. | සේවක ණය ශේෂ අයකළ යුතුය. |